**ජාතික ගමනාගමන කොමිෂන් සභාව - 2015**

---------------------------------------------------------

ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 37 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

--------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද, යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැළසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැළකිල්ලට ගන්නා නමුත් කොමිෂන් සභාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

---------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 03 ප්‍රකාරව අස්ථිත්වයක් විසින් පූර්ව කාල පරිච්ඡේදවලදී සිදුවී ඇති වැරදි සොයා ගැනීමෙන් පසුව නිකුත් කරන පළමු මූල්‍ය ප්‍රකාශන කට්ටලයෙහිම අතීතානුයෝගීව නිවැරදි කිරීම් කළයුතු වුවත් සමාලෝචිත වර්ෂයේදී පසුගිය වර්ෂයට අදාළව කරන ලද ගැලපීම් රු.11,739,604 ක් සමුච්චිත අරමුදලට ගලපා තිබුණි.

#### 2.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

සමාලෝචිත වර්ෂය තුළදී පුනරාවර්තන හා ප්‍රාග්ධන වියදම් සඳහා කොමිෂන් සභාව වෙත ලැබුණු මුදලින් පිළිවෙලින් රු.25,223,492 ක් හා රු.23,375,300 ක් වශයෙන් රු.48,598,793 ක මුදලක් ඉතිරිවී තිබූ අතර ප්‍රාග්ධන වියදම් සඳහා වෙන් කරන ලද මුදලින් රු.124,007,439 ක් බාහිර ආයතන වෙනුවෙන් වත්කම් සැපයීමට යොදවා තිබුණි. මෙම වත්කම් බාහිර ආයතනවලට පවරා හා පැවරීමට නියමිතව තිබූ අතර එම සම්පූර්ණ මුදලම ආදායමට එරෙහිව ලියාහැරීමේ ප්‍රතිපත්තිය අනුගමනය කිරීම හේතුවෙන් එම වත්කම් කිසිදු ආයතනයක වත්කමක් ලෙස ගිණුම්ගත වී නොතිබුණි. සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 3 තුළ පමණක් බාහිර ආයතන වෙනුවෙන් ඉදිකළ වත්කම්වල වටිනාකම රු.403,129,613 ක් විය. එම වත්කම් සඳහා රාජ්‍ය ප්‍රදානයට අතිරේකව සභාව විසින් රු.106,207,595 ක් වැයකර තිබූ බවත් එය සභාවේ අයභාර වියදමක් ලෙස ගිණුම්ගතකර තිබූ බවත් තවදුරටත් අනාවරණය විය.

#### 2.2.3 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2015 දෙසැම්බර් 31 දිනට වූ රු. 468,920,000 ක කෙටිකාලීන තැන්පතු සඳහා ලැබුණු රු.14,373,143 ක පොලිය නැවත ආයෝජනය කර තිබූ බැවින් එම පොලිය ආයෝජන ගිණුමට හර කිරීම වෙනුවට ලැබිය යුතු පොළී ආදායම් ගිණුමකට හර කර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළදී රජයේ ප්‍රදාන යටතේ මිලට ගෙන තිබූ රු. 21,806,808 ක වත්කම් වෙනුවෙන් සිදුකර තිබූ රු. 1,036,399 ක් වූ ක්ෂය වෙන්කිරීම්වලට සමාන මුදලක් ක්‍රමක්ෂය කර නොතිබුණි.

(ඇ) ඉකුත් වර්ෂයේදී ප්‍රාග්ධන වත්කම් අත්පත්කර ගැනීම සඳහා ලද රු. 18,189,547 ක් ප්‍රාග්ධන ප්‍රදාන ලෙස ගිණුම්ගත නොකර පුනරාවර්තන ලැබීමක් ලෙස ගිණුම්ගතකර තිබුණු අතර සමාලෝචිත වර්ෂය තුළ ප්‍රාග්ධන ප්‍රදාන මගින් මිලදීගත් රු. 16,991,221 ක ප්‍රාග්ධන ස්වරූපයේ වත්කමක් ප්‍රාග්ධනිත කිරීමකින් තොරව ව්‍යාපෘති වියදමක් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඇ) බැස්ටියන් මාවතේ වැසිකිළි පද්ධතිය වෙනුවෙන් ලැබිය යුතු රු. 525,000 ක ගාස්තුව ගිණුම්ගත කර නොතිබුණි.

**2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

1971 අංක 38 දරන මුදල් පනතේ 11 වගන්තිය හා 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රල්ඛයේ 4.2.2 වගන්තිය පරිදි මුදල් අමාත්‍යවරයාගේ එකඟතාවය හා විෂය භාර අමාත්‍යවරයාගේ අනුමැතියකින් තොරව සමාලෝචිත වර්ෂයේදී ස්ථාවර තැන්පතු සහ භාණ්ඩාගාර බිල්පත්වල පිළිවෙලින් රු.22,902,607 ක් සහ රු.9,877,650 ක් ආයෝජනය කර තිබුණි.

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රතිඵලය රු.157,694,985 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ රු.162,252,416 ක අතිරික්තයක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ අතිරික්තය රු.4,557,431 කින් පිරිහී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2011 හා 2012 වර්ෂවලදී පිළිවෙලින් රු. 186,879,785 ක් හා රු. 16,053,010 ක අතිරික්තයක් පෙන්නුම් කළද රජයේ පුනරාවර්තන ප්‍රදාන නොලැබීම නිසා 2013 වර්ෂයේ රු. 186,871,271 ක ඌනතාවයක් බවට පත්වී තිබුණි. සේවක පාරිශ්‍රමික, රාජ්‍ය බදු හා ජංගම නොවන වත්කම් සඳහා ක්ෂයවීම් ගැලපීමෙන් පසු 2013 වර්ෂයේ හැර කොමිෂන් සභාවේ දායකත්වයේ වර්ධනයක් සිදුවී තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ දායකය රු.316,144,073 ක් විය.

**3.2 ආයතනයට එරෙහිව හෝ ආයතනය විසින් ආරම්භකර ඇති නෛතික සිද්ධි**

බාහිර ආයතන හා බාහිර පුද්ගලයින් විසින් කාලසටහන් ක්‍රියාත්මක කිරීම, මගී සේවා අවසරපත් ලබාදීම, උසස්වීම් අධිවේගී මාර්ග බලපත් අවලංගු කිරීම, බැස්ටියන් මාවත බස්නැවතුමේ පවත්වාගෙන ගිය ආසන වෙන් කිරීමේ කාර්යාලය ඉවත් කිරීම, ධාවන වේලාවන් වෙනස් කිරීම, පුවත්පත් දැන්වීම්වලට නොගෙවීම යන කරුණු සම්බන්ධයෙන් කොමිෂන් සභාවට එරෙහිව නඩු 46 ක් ගොනුකර තිබුණි.

**4. මෙහෙයුම් සමාලෝචනය**

**4.1 කාර්යසාධනය**

මගී ප්‍රවාහනයට අදාළ ජාතික ප්‍රතිපත්තිය පිළිබඳව ශ්‍රී ලංකා රජයට උපදෙස් දීම සහ පොදුජන ප්‍රවාහන අවශ්‍යතාවයන් සපුරාලීම සඳහා කාර්යක්ෂම බස් ප්‍රවාහන පද්ධතියක් ක්‍රියාත්මක වන බවට සහතිකවීම සඳහා අවශ්‍ය නියාමන රාමුවක් සකස් කිරීම කොමිෂන් සභාවේ මෙහෙවර වන අතර එය ඉටුකිරීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කොමිෂන් සභාව විසින් 2009 වර්ෂයේ දී ප්‍රකාශයට පත් කරන ලද ප්‍රවාහන ප්‍රතිපත්තියෙහි අන්තර්ගත මගී ප්‍රවාහනයට අදාළ ඇතැම් කරුණු වර්තමානයට ගැලපෙන පරිදි අවශ්‍ය සංශෝධනයන් සිදුකිරීම සඳහා රජයට උපදෙස් ලබාදීමට කටයුතු කළ යුතු වුවත් එසේ අවශ්‍ය උපදෙස් රජයට ලබාදීමට කටයුතු කර නොතිබුණි.

(ආ) මගී ප්‍රවාහන අවශ්‍යතා සපුරාලීමේ දී විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින්ට බස් පර්යන්තයට හා බස්රථ වලට ප්‍රවේශවිය හැකි වන පරිදි බස් නැවතුම්පලවල් සකස් කිරීමට ජාතික ගමනාගමන කොමිෂන් සභාව මැදිහත්ව කටයුතු කළයුතු වුවත් එවැනි මැදිහත් වීමක් සිදුකර නොතිබුණි.

(ඇ) වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව සැලසුම්කරන ලද පහත සඳහන් ඉලක්කයන් සම්පූර්ණ කරගත නොහැකිවී තිබුණි.

(i) සමාලෝචිත වර්ෂය අවසන් වන විට ගැමිසැරිය බස් සේවා 40 ක් පවත්වාගෙන යාමට සැලසුම්කර තිබුණද 2015 දෙසැම්බර් 31 දිනට ධාවනය වෙමින් පැවතුනේ සේවාවන් 14 ක් පමණි. එම නිසා ප්‍රතිපාදිත රු.මිලියන 20 කින් රු.මිලියන 13.26 ක් උපයෝජනය කර නොතිබුණි.

(ii) සමාලෝචිත වර්ෂය තුළදී මගී ඉල්ලුම හා සේවා සැපයීම පිළිබඳ සමීක්ෂණ 50 ක් සිදු කිරීමට සැලසුම් කර තිබුණද වර්ෂය අවසන් වන විට සමීක්ෂණ 24 ක් අවසන් කර තිබුණු අතර සියයට 26 ක ප්‍රතිපාදන උපයෝජනය කර නොතිබුණි.

(iii) සමාලෝචිත වර්ෂය තුළදී අන්තර් පළාත් මාර්ග 514 ක කාලසටහන් පිළියෙල කිරීම හා ක්‍රියාත්මක කිරීමටත් උතුර, උතුරු මැද හා නැගෙනහිර පළාත්වල බස් ගාස්තු සංශෝධනය හා නිවැරදි කිරීමට සැලසුම්කර තිබුණද අන්තර් පළාත් මාර්ග 210 ක කාලසටහන් පමණක් වැඩිදියුණු කර උතුරු පළාතේ සහ උතුරුමැද හා නැගෙනහිර පළාත්වල කොටසක බස් ගාස්තු පමණක් සංශෝධන හා නිවැරදි කිරීම් කර තිබුණි. ඒ අනුව මෙහි මුළු ප්‍රගතිය පිළිවෙලින් සියයට 41 ක් හා සියයට 65 ක් පමණක් වී තිබුණි.

(iv) බස් මගීන්ට දුරගමන් සේවා බස් නැවතුම්පළවල් පහසුවෙන් හඳුනාගත හැකි වන පරිදි සීමිත නැවතුම් සංඥා පුවරු 250 ක් දිවයින පුරා ස්ථාපිත කිරීමට සැලසුම්කර තිබුණද වර්ෂය අවසාන වන විට සවිකර තිබුණේ සංඥා පුවරු 19 ක් පමණි. සංඥා පුවරු ඉදිකිරීමේ ප්‍රගතිය සියයට 7.6 ක් පමණ වුවත් ඒ සඳහා මුළු ප්‍රතිපාදන වලින් සියයට 33 ක් උපයෝජනය කර නොතිබුණි.

(v) මැදගම හා කින්නියා බස් නැවතුම්පළ දෙකෙහි ඉදිකිරීම් කටයුතු සඳහා සමාලෝචිත වර්ෂයේදී රු. 30,000,000 ක් වෙන්කර තිබූ අතර වර්ෂය තුළදීම නිම කිරීමට සැලසුම්කර තිබුණද වර්ෂය අවසන් වන විටත් නිම කර තිබුණේ බස්නැවතුම්පළ ඉදිකිරීම්වලින් පිළිවෙලින් සියයට 60 ක් හා සියයට 50 ක් පමණි.

(vi) වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව සමාලෝචිත වර්ෂය තුළදී දුරගමන් සේවා මගීන්ගේ පහසුව සඳහා කෙටිකාලීන විවේක මධ්‍යස්ථාන 05 ක් වැඩි දියුණු කිරීමට සැලසුම් කළද එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර නොතිබුණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

-------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අන්තර් පළාත් බස්රථ හා පළාත තුළ ධාවනය වන බස්රථවල කාලසටහන් ප්‍රදර්ශනය කිරීමේ අරමුණින් කොමිෂන් සභාව විසින් 2013 වර්ෂයේදී රු. 62,415,360 ක් වැයකර විද්‍යුත් පුවරු 07 ක් කොළඹ බැස්ටියන් මාවත, අනුරාධපුර, කුරුණෑගල, නුවරඑළිය, කතරගම, රත්න හා පුත්තලම යන ස්ථානවල සවිකර තිබූ නමුත් එම පුවරු සියල්ලම වසර දෙකක කාලයක සිට අක්‍රියව පැවතුණි. 2016 ජූනි 15 දින වන විටත් එම පුවරු යථාතත්ත්වයට පත්කර ගැනීමට ආයතනයේ කළමනාකාරිත්වය අපොහොසත් වී තිබුණි.

(ආ) බැස්ටියන් මාවත බස් පර්යන්තයේ කටයුතු එහි කළමනාකරුට හා කොමිෂන් සභාවේ සභාපතිවරයාට තම කාර්යාලයේ සිට අධීක්ෂණය කළ හැකි වන පරිදි රු. 470,250 ක් වැයකර 2014 ජූනි මාසයේදී සවිකරන ලද සීසීටීවී කැමරා 16 කින් කැමරා 09 ක් 2014 දෙසැම්බර් සිට විගණිත දිනය වූ 2016 ජූලි මාසය වන විටත් අක්‍රියව පැවතුණි. කැමරා අක්‍රියව තිබුණද අන්තර්ජාල සම්බන්ධතාවයන් වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී මාසයකට රු. 61,862 බැගින් රු. 742,341 ක මුදලක් ගෙවීමට සිදුවී තිබුණි.

(ඇ) කොළඹ - කටුනායක අධිවේගී මාර්ගයේ බස් රථ ධාවනය සඳහා නිත්‍ය බලපත්‍ර නිකුත් කිරීම 2016 ජූනි 15 දින වන විටත් ආරම්භ කර නොතිබුණි. තවද දක්ෂිණ අධිවේගී මාර්ගය ඔස්සේ විවිධ ගමනාන්ත දක්වා 2015 ජූලි 25 වන දින සිට ධාවනය කරනු ලබන බස් රථ වෙනුවෙන් දිනකට රු. 2,500 බැගින් අයකර තාවකාලික බලපත්‍ර 65 ක් ලබාදී තිබූ අතර 2016 ජූනි මාසය වන විටත් නිත්‍ය බලපත්‍ර ලබාදීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) අන්තර් පළාත් බස්රථ ධාවනය සිදුවන ආකාරය චන්ද්‍රිකා තාක්ෂණය උපයෝගී කරගෙන ජාතික ගමනාගමන කොමිෂන් සභාවට සෘජුවම අධීක්ෂණය කළ හැකි වන පරිදි රු.79,061,375 ක මුදලක් වැය කර බස්රථවල සවිකරන ලද ජීපීඑස් උපකරණ 2095 කින් උපකරණ 1307 ක් 2015 දෙසැම්බර් 31 දින වනවිට නිසි කළමනාකාරිත්වයකින් හා නිසි පරිදි නඩත්තු කිරීමකින් තොරව පවත්වාගෙන යාම නිසා අක්‍රියව පැවතීම හේතුවෙන් රු.37,512,288 ක් වැයකර ඉදිකරන ලද නව පාලන මැදිරිය ද භාවිතයට ගැනීමට නොහැකිවී තිබුණි.

(ඉ) මාර්ග බලපත්‍ර නිකුත් කිරීම සඳහා තෝරාගත් අයදුම්කරුවන් බලපත්‍ර ලබාගැනීම සඳහා ඉදිරිපත් නොවීම හේතුවෙන් 2014 වර්ෂයේදී කොළඹ සහ තදාසන්න ප්‍රදේශවල සිට උතුරු නැගෙනහිර දක්වා මාර්ග 14 ක් වෙනුවෙන් බලපත්‍ර 84 ක් සඳහා මිල ගණන් කැඳවා තිබුණ ද 2016 මැයි 31 දින වන විට බලපත්‍ර 21 ක් පමණක් නිකුත් කර එසේම සමාලෝචිත වර්ෂය තුළදී ද මාර්ග 10 ක් වෙනුවෙන් බලපත්‍ර 13 ක් සඳහා මිල ගණන් කැඳවා තිබුණද බලපත්‍ර 05 ක් පමණක් නිකුත් කර තිබුණි. මිල ගණන් කැඳවීමේදී ප්‍රමාණවත් ලංසු සුරක්ෂණයක් ලබාගැනීමට ක්‍රියා නොකිරීම නිසා තෝරාගත් අයදුම්කරුවන් බලපත්‍ර ලබාගැනීමට ඉදිරිපත් නොවී තිබූ බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ඊ) අධිවේගී මාර්ගයේ පිටත වටරවුම් මාර්ගය හරහා ප්‍රධාන නගරවලට බස් ධාවනය කිරීමේ හැකියාව පිළිබඳ ශක්‍යතා අධ්‍යයනයක් සිදුකර වාර්තාවක් ලබාදීම සඳහා මොරටුව විශ්ව විද්‍යාලය වෙත භාරදී තිබුණි. ඒ අනුව මොරටුව විශ්වවිද්‍යාලය මගින් කෙටුම්පත් අතුරු වාර්තාවක් 2015 අගෝස්තු 04 වෙනි දින කොමිෂන් සභාව වෙත ලබාදී තිබුණු අතර ඒ වෙනුවෙන් 2015 සැප්තැම්බර් 04 වෙනි දින රු. 1,418,310 ක මුදලක් අත්තිකාරම් වශයෙන් ලබාදී තිබුණ ද ඒ සඳහා ඉදිරි ක්‍රියාමාර්ග ගත් බවට නිරීක්ෂණය නොවිය.

(උ) සියළුම මගී ප්‍රවාහන සේවාවන් ඒකාබද්ධ චක්‍රීය කාලසටහනකට අනුව ධාවනය කරවීම රජයේ ප්‍රතිපත්තිය බැවින් 2013 දෙසැම්බර් මාසය තුළදී ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ මැදිහත් වීමෙන් පිළියෙල කරන ලද ඒකාබද්ධ කාල සටහන සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගෙන තිබුණද 2016 සැප්තැම්බර් 30 දින වනවිටත් එය ක්‍රියාත්මක කර නොතිබුණි.

### 4.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්

---------------------------

වව්නියාව බස් නැවතුම්පලේ පළමු අදියරේ කටයුතු 2015 වර්ෂයේ ජූනි මාසයේදී නිමකර තිබූ අතර ඒ සඳහා රු. 104,746,181ක මුදලක් වැයවී තිබුණි. එහෙත් බස්නැවතුම්පලේ භූමිය සකස් කිරීමේ කාර්ය දෙවන අදියරට ඇතුළත්කර තිබූ බැවින් එම අදියර 2016 ජූනි මාසය වන විටත් අවසන්වී නොතිබුණි.

එබැවින් බස්නැවතුම්පල මේ දක්වා භාවිතයට ගැනීමට නොහැකිවී තිබුණි.

**4.4 දෘෂ්‍ය අක්‍රමිකතා**

සිසුසැරිය බස්රථ ධාවනය සඳහා වූ ගෙවීම් පරීක්ෂා කිරීමේ දී එකම බස්රථයක් මාර්ග දෙකක සිසුසැරිය ධාවනය සඳහා යොදවන බව ව්‍යාජ ලෙස සඳහන් කර පුද්ගලයන් දෙදෙනෙකුගේ නමින් රු.6,941,862 ක මුදලක් කොමිෂන් සභාවෙන් ලබාගෙන තිබුණි.

**4.5 අරමුදල් ඌන උපයෝජනය**

සමාලෝචිත වර්ෂය තුළදී විවිධ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා මහා භාණ්ඩාගාරය විසින් රු. 685,000,000 ක මුදලක් කොමිෂන් සභාව වෙත ලබා දී තිබූ අතර ඉන් රු. 636,401,206 ක් පමණක් උපයෝජනය කර තිබුණි. විධිමත් පුරෝකථනයකින් තොරව මුදල් ලබාගැනීම මත ඉතිරිවූ රු. 48,598,739 ක මුදල ආයෝජනය කර තිබුණි.

**4.6 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනතේ 47 වන වගන්තිය හා 1985 අංක 1 දරන සේවක අර්ථසාධක අරමුදල් (සංශෝධන) පනතේ 9(2) වගන්තිය අනුව අර්ථසාධක අරමුදලේ හා සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදලේ දායක මුදල සහ පාරිතෝෂික දීමනාව ගණනය කිරීමේදී අන්තර් දීමනා හා විශේෂ දීමනා සහිතව පාරිතෝෂික දීමනා ගණනය කිරීම නිසා පිළිවෙලින් රු.11,344,443 ක හා රු.697,641 ක දායක මුදල් වැඩිපුර ගෙවා තිබුණි.

**4.7 කාර්ය මණ්ඩල පරිපාලනය**

2015 දෙසැම්බර් 31 දිනට අනුමත කාර්ය මණ්ඩලය සහ තථ්‍ය කාර්ය මණ්ඩලය සැසඳීමේදි තනතුරු 76 ක පුරප්පාඩු පැවති අතර ඉන් විධායක මට්ටමේ පුරප්පාඩු 16 පැවතුණි. 2016 මැයි 31 දින වන විට ඉන් තනතුරු 03 ක් බඳවාගෙන තිබුණි. අනෙක් විධායක තනතුරු සඳහා වැඩබැලීමේ පදනම මත එම තනතුරුවල රාජකාරී අවරණය කර තිබුණි.

**4.8 නොවිසඳී ඇති විගණන ඡේද**

2014 මාර්තු 06 දින පැවති පොදු ව්‍යාපාර කාරක සභා රැස්වීමේ දී වලංගු මාර්ග බලපත්‍රයක් නොමැතිව බස් ධාවනය කිරීම සම්බන්ධයෙන් ඇති නීති රීති ප්‍රමාණවත් නොවන බව අනාවරණය වී තිබුණි. ඒ අනුව පනතේ අදාළ වගන්ති සංශෝධනය කර මාස දෙකක් ඇතුළත කැබිනට් මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමට එකඟවී තිබුණද 2016 ජුනි මාසය දක්වාම අදාළ සංශෝධන කැබිනට් මණ්ඩලයේ අනුමැතියට ඉදිරිපත්කර නොතිබුණි.

**5. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය**

**5.1 අයවැය ලේඛනමය පාලනය**

සමාලෝචිත වර්ෂයට අදාළ අයවැයගත වියදම් තථ්‍ය වියදම් සමඟ සංසන්දනය කිරීමේදී වැය විෂයයන් 24 කට අදාළව සියයට 10 සිට සියයට 179 ක් දක්වා පරාසයක් තුළ විචලනයන් වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් වශයෙන් යොදාගෙන නොතිබූ බව විගණනයේදී නිරීක්ෂණය විය.

**5.2 ප්‍රසම්පාදන සැලැස්ම**

---------------------
පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කොමිෂන් සභාව විසින් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 ඡේදයට හා ප්‍රසම්පාදන කාර්ය සංග්‍රහයේ දැක්වෙන ආකෘතියට අනුව 2015 වර්ෂය සඳහා ප්‍රධාන ප්‍රසම්පාදන සැළැස්මක් පිළියෙල කර තිබුණද ඒ සඳහා විධිමත් අනුමැතියක් ලබාගෙන නොතිබුණි.

(ආ) පිළියෙල කරන ලද ප්‍රසම්පාදන සැලැස්මේ තොරතුරු අයවැය හා ක්‍රියාකාරී සැලැස්ම සමඟ එකඟ නොවීම, ක්‍රියාකාරී සැලැස්මේ හා අයවැය ලේඛනයේ ඇතුළත් නොවූ අයිතම ප්‍රසම්පාදන සැලැස්මේ ඇතුළත්වීම, ප්‍රසම්පාදන සැලසුමට අනුව ක්‍රියා නොකිරීම වැනි කරුණු නිරීක්ෂණය විය.

**5.3 වාර්ෂික වාර්තා සභාගත කිරීම**

-------------------------------
1971 අංක 38 දරන මුදල් පනතේ 12(3) වගන්තිය හා 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී /12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.3 වගන්තිය ප්‍රකාරව ආයතනයේ වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත් 2014 වර්ෂයට අදාළ වාර්ෂික වාර්තා 2016 සැප්තැම්බර් 30 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි. එම චක්‍රලේඛයේම 6.5.1 වගන්තිය ප්‍රකාරව 2015 වාර්ෂික වාර්තාවේ කෙටුම්පතක් වාර්ෂික ගිණුම් සමඟ ඉදිරිපත්කර නොතිබුණි.

**6. පද්ධති හා පාලනයන්**

----------------------
විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු පිළිබඳව වරින්වර කොමිෂන් සභාවේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුවේ.

| | පද්ධති පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | කොන්ත්‍රාත් පාලනය | ගිවිසුමේ කොන්දේසි අනුව කටයුතු නොකිරීම හා ලංසු කැඳවීම තුළින් මගී සේවා බලපත්‍ර නිකුත් නොකිරීම. |
| (ආ) | වාහන උපයෝජනය | මුදල් රෙගුලාසි හා චක්‍රලේඛ ප්‍රකාර වාහන පාලනය සිදු නොකිරීම හා වාර්තා තබා නොගැනීම. |
| (ඇ) | කාර්ය මණ්ඩල පරිපාලනය | පුරප්පාඩු සඳහා සේවකයින් බඳවා ගැනීමට කටයුතු නොකිරීම. |